www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදී සමානතා පක්ෂයේ කොළඹ මැයි දින රැස්වීම

## Socialist Equality Party May Day meeting in Colombo

2005 අප්‍රේල් 22

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය ජාත්‍යන්තර කම්කරු දිනය සමරනු වස් මැයි 1 දා කොළඹ දී ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වනු ඇත.

මැයි දිනය හා බැඳුනු මූලික මූලධර්ම වන කම්කරු පන්තියේ ජාත්‍යන්තර ඒකාබද්ධතාව ද සමාජවාදය සඳහා දේශපාලන අරගලය ද සමස්ත කම්කරු පන්තියට ම අතිශයින් වැදගත් කාරනා බවට පත්ව තිබේ. ඇෆ්ඝනිස්ථානය හා ඉරාකය තුල එක්සත් ජනපද මිලිටරිවාදයේ පැනනැඟීම ද නව යුද්ධ පිලිබඳව වැඩෙන අන්තරායන් ද මධ්‍යයේ, සියලු ම රටවල කම්කරුවන් ස්වකීය පන්ති අවශ්‍යතා සඳහා සටන් වැදීමේ පොදු මූලෝපායකට බැඳීගැනීම අත්‍යවශ්‍ය කාරනාවක් වී ඇත.

ලොව වටා සංගත ප්‍රභූන් ද ඔවුන්ගේ දේශපාලන ආවතේවකරුවන් ද අත මනුෂ්‍ය වර්ගයා මුහුන දෙන දිගහැරෙන අර්බුදයන්ට කිසිදු විසඳුමක් නොමැත. ඔවුහු වෙලඳ පොලවල්, ලාභ ශ්‍රමය හා සම්පත් උදෙසා සිය ප්‍රතිවාදීන්ට එරෙහිව තියුනු අරගලයක යෙදී සිටින අතර ම සිය රටවල් තුල දී කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට හා ජීවන තත්වයන්ට එරෙහිව පන්ති යුද්ධයක් ද ගෙන යති.

වැඩ කරන ජනතාවගේ අති මූලික අවශ්‍යතා සපුරාලීමෙහි ලා ධනවාදයේ පවත්නා නොහැකියාව ආසියානු සුනාමි ව්‍යසනය මගින් සුපැහැදිලිව එලිදරව් කෙරී ඇත. ශ්‍රී ලංකාව තුල, දස දහස් සංඛ්‍යාත ජනයා තමන් මුහුන දෙන තතුවල ක්ෂනික වැඩිදියුනුවක් පිලිබඳ මොන යම් හෝ බලාපොරොත්තුවකින් තොරව ඛේදනීය කොන්දේසි යටතේ තවමත් දිවි ගෙවති. මෙම ඛේදජනක සිද්ධිය රටේ සිවිල් යුද්ධය අවසන් කරලීමේ නව අධිෂ්ඨානයකට පෙරලෙනු ඇතැයි යනුවෙන් කෙරුනු සියලු ප්‍රතිඥා මිථ්‍යාවන් බවට ඔප්පු වී ඇත. ඒ වෙනුවට, මහජනතාවට දීමට කිසිවක් නැති පාලක පන්තිය විසින් වර්ගෝත්තමවාදී සතුරුකම් අවුලනු ලැබේ.

සාමාන්‍ය මහජනතාවගේ ප්‍රතිචාරය හරියට ම ඊට විරුද්ධ දිශාවට යොමුව ඇත. ආන්ඩුව උදව් කිරීමට කිසිවක් නොකරන බව දන්නා කම්කරුවන්, ශිෂ්‍යයන්, වෘත්තිකයන්, ධීවරයන් සහ ගොවීහු නොමසුරුව සිය කාලය, මුදල් හා භාන්ඩ වැය කරමින්, ආගම, ජනවර්ගය හෝ කතා කරන භාෂාව නොතකා, විපතට පත්වූවන්ට උදව් කිරීමට ඉදිරිපත් වූහ. මෙම ප්‍රතිචාරය මගින් අති මූලික රූපාකාරයකින් එලිදරව් කෙරුනේ, ඒකාබද්ධව, ධනවත් අතලොස්සක ලාභ වෙනුවට, තමන්ගේ අවශ්‍යතා හා අභිලාෂයන් සපුරාලන සමාජයක් හැඩගැස්වීම පිනිස කම්කරු පන්තිය සතුව පවත්නා අති මහත් ධාරිතාවන් ය.

අපගේ මැයි දින ප්‍රසිද්ධ රැස්වීමට සහභාගි වන ලෙස අපගේ සියලු පාඨකයන් හා ආධාරකරුවන් වෙත සසප සිය උනුසුම් ආරාධනා යොමු කර සිටී.

**ස්ථානයඃ නව නගර ශාලාව, ග්‍රීන්පාත්, කොලඹ.**
**වේලාවඃ මැයි 1 දා සවස 3.00**
**කථිකයාඃ සසප ප්‍රධාන ලේකම් හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජික විජේ ඩයස්**